**අලව්ව ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
  - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු සැපයුම් ණයහිමියන් ද්විගණනය වීම හේතුවෙන් රු.369,870 ක්, කර්මාන්ත ණයහිමි රු.20,027 ක් හා වටිනාකම රු.8,550,000 ක් වූ යෝජිත ව්‍යාපෘති 40 ක් ගිවිසුම්ගත වීමකින් තොරව ණයහිමියන් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් හා ණයහිමි වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී 2023 වර්ෂය සඳහා කලින් ලද ආදායම් රු.17,750ක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | කලින් ලද ආදායම් ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හා සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පුස්තකාල පොත් අගය රු.41,294 ක් ද, පොදු ගබඩා අතැති තොග හිමි රු.55,059 කින් හා ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.1,200,431 ක වෙනසක් විය. | 2023 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ වෙනස්කම් හඳුනාගෙන ලේඛන නිවැරදි කර, ගිණුම් නිවැරදි කළ යුතුය. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොලිය සමඟ රු.2,531,458 ක් වටිනා ස්ථාවර තැන්පතුවක් සභා අනුමැතියකින් තොරව සහා අරමුදලට මාරු කර තිබුණි. | කොරෝනා වසංගතය හා රටේ පැවති ආර්ථික තත්ත්වය මත සභාවේ අත්‍යාවශ්‍ය වියදම් සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම මත වෙනත් වසර වල කටයුතු කර ඇති ආකාරයෙන් මෙහිදී ක්‍රියාකර ඇති බව. | මනා මූල්‍ය පාලනයක් සහිතව කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත - ප්‍රාදේශීය සභා රීති 61 | වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු සහ ව්‍යාපාර බදු පිළිබඳ සමීක්ෂයක් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේදී සමීක්ෂණ සිදු කර ලබාගන්නා ලද ලැයිස්තු සියල්ලම ලේඛනගත කිරීමට කටයුතු කරන බවත් එයට අනුව සියලුම බලපත්‍ර හිඟයකින් තොරව ලබා ගැනීමට අදාල පියවර ගන්නා බව. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - මු.රෙ. 371 (3) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.62,000 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | ඉදිරි වර්ෂවලදි අදාල වර්ෂයේදීම අත්තිකාරම් පියවීමට කටයුතු කරන බව. | අදාළ මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,877,344 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.530,541 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 7,861 | 5,950 | 4,939 | 2,012 | 5,392 | 4,748 | 3,746 | 1,001 |
| කුලී | 9,686 | 9,550 | 9,589 | 8 | 12,128 | 6,996 | 6,969 | 47 |
| බලපත්‍ර ගාස්තු | 1,021 | 576 | 576 | - | 977 | 484 | 484 | - |
| වෙනත් ආදායම් | 6,683 | 9,979 | 9,979 | | 6,407 | 5,121 | 5,121 | - |
| **එකතුව** | 25,251 | 26,055 | 25,083 | 2,020 | 24,904 | 17,349 | 16,320 | 1,048 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.1,001,615 ක හිඟයෙන් රු.624,450 ක මුදලක්ද වර්ෂයේ බිල්කිරීම් රු5,950,667 මුදලින් රු.1,387,714 ක මුදලක් අයකර නොතිබුණි. | ඉදිරියේදී හිග ආදායම අය කර ගැනීමේ වැඩසටහන් මඟින් එම මුදල් අය කර ගැනිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.19,240,898 ක පුනරාවර්තන වියදම් දරා දිරන කසළ ටොන් 302 ක් හා නොදිරන කසළ ටොන් 126 ක් ද රැස්කර තිබුණි. දිරන කසළ මඟින් වර්ෂය තුළ කොම්පෝස්ට් ටොන් 64ක් නිෂ්පාදනය කර ටොන් 57 ක් අලෙවි කිරීමෙන් රු.860,595 ක ආදායමක් රැස්කර තිබූ අතර, නොදිරන කසළ ටොන් 17 ක් අලෙවි කර රු.550,542 ක ආදායමක් ද රැස්කර තිබුණි. | අලව්ව ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය නාගරික අපද්‍රව්‍ය නිසිලෙස කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යන බව. | දිරන කසළ හා නොදිරන කසළ නිසි ලෙස කළමනාකරණය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිය 2022 වර්ෂය දක්වා ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිලි අනුකූලතා සහතික 11ක් නිකුත් කර තිබූ නමුත් එම ඒකක සඳහා තක්සේරුවක් ලබාගෙන වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අනුකූලතා සහතික ලබා ගැනිමත් සමඟ නැවත තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර වරිපනම් ගාස්තු අය කිරිමට කටයුතු කරන බව. | ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය කර විකිණීමට අදාළ අලෙවි වටිනාකමින් සියයට 1 ක බදු මුදලක් සභාව වෙත ලබාගත යුතු වුවත් කොහොඹගහමුල කම්මල් දෙණිය වත්ත ඉඩමෙන් විකුණුම් වටිනාකමට වඩා අවම වටිනාකමක් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව සභාවට රු.169,425ක පාඩුවක් සිදුවී තිබුණි. | ඉඩම් විකුණනු ලැබූ වටිනාකම තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉතිරි හිඟ 1% බදු මුදල අදාල වෙන්දේසිකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. | අදාල ආයතනයේ විකුණුම් වාර්තා ගෙන්වාගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අලව්ව බස්නැවතුම්පල කඩ කාමර පැරණි බදුකරුවන් සඳහා ටෙන්ඩර් කිරීමකින් තොරව ලබා දී තිබුණද එම බදුකරුවන්ගෙන් තක්සේරුගත එකවර මුදලින් 50% ක මුදල් ලබාගැනීම සඳහා 2016 වර්ෂයේ සභාව විසින් තීරණය කර තිබුණද, පැරණි බදුකරුවන්ගේ ඉල්ලීමක් මත එය වාරික 60 කින් ගෙවීම සඳහා සහන කාලය ලබා දී තිබුණි. ඒ අනුව මෙම පැරණි බදුකරුවන් විසින් 2016 මැයි සිට 2021 අප්‍රේල් මස වන විට මෙම එකවර මුදල රු. 21,000,000 ක් ගෙවා නිමකල යුතු වුවත් 2023 අප්‍රේල් වන විටත් කිසිදු වාරිකයක් ගෙවා නොතිබුණි. | අලව්ව බස් නැවතුම්පොළ කඩ කාමර ටෙන්ඩර් කිරීමේදී පැරණි බදු කරුවන් සඳහා ටෙන්ඩර් කිරීමකින් තොරව කඩ කාමර ලබා දීම සිදු කර තිබුණද එම බදු කරුවන්ගෙන් තක්සේරු ගත මුදලින් 50% මුදලක් ලබා ගන්නා ලෙසත්, එය වාරික 60 කින් ගෙවීම සඳහා සහන කාලයක් ලබා දී තිබුණු බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් 10 ක් සමාලෝචිත වර්ෂය වන විටත් සභාවට පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීම් කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව පරිහරණය කරන ලද ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වීදි ලාම්පු මිලදී ගැනීමේදී බල්බ් සඳහා අවම මිල වූ රු.839 ඉදිරිපත් කර තිබූ මිල ප්‍රතික්ෂේප කර පස්වෙනියට අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයේ රු.1,246.50 බැගින් වොට් 23 CFL බල්බ 1,000 ක් මිලදී ගැනීම නිසා සභාවට රු.407,500ක අලාභයක් සිදුව තිබුණි. | බල්බ් සඳහා අවම මිල වූ රු.839 ඉදිරිපත් කර තිබූ මිල ප්‍රතික්ෂේප කරමින් පස්වෙනියට අවම මිල ඉදිරිපත් කර තිබූ මිල මත බල්බ් මිලදී ගැනීම තීරණය කර තිබුණු බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව විවෘත මිල ගණන් කැඳවා තරඟකාරීත්වයට යොමුකර සභාවට උපරිම ලෙස වාසිදායක ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගත යුතුය. |

**04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතුව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් පැවතියද ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ප්‍රමිතිගත ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් නොමැති වුවත් සභාව විසින් සභා බල ප්‍රදේශයේ ගලි අපද්‍රව්‍ය ගලි රථය යොදවා ඉවත් කර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ වලක් හාරා ඒ තුළට දැමීමට කටයුතු කර තිබුණි. ඒ අනුව නියමිත ප්‍රතිචක්‍රීකරණ ක්‍රමවේදයක් නොමැතිව සමාලෝචිත වර්ෂය තුළද ගලි රථ 53ක් පමණ රැගෙනවිත් කසළ මධ්‍යස්ථාන භූමියට බැහැර කිරීමට කටයුතු කර තිබුණි. | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කොන්ක්‍රීට් කැට ඇල්ලූ උරාගැනීමේ වලක් ඉදිකර ඇති අතර එම වල පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගලි අපද්‍රව්‍ය ඉවත් කිරීමට සේවා ලාභීන්ගෙන් මුදල් අයකිරීම සිදු කරනු ලැබේ. මේ නිසා දෛනිකව අපද්‍රව්‍ය ඉවත් කිරීමක් සිදු නොවන අතර වලේ අඩුවන ප්‍රමාණය මත අපද්‍රව්‍ය එයට බැහැර කිරීම සිදු කරන බව. | පරිසරය ආරක්ෂා වන පරිදි කසළ බැහැර කිරීම සිදුකළ යුතුය. |